# 9 රචනය

භාෂාව උපයෝගි කරගෙන අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමේ එක් ක්‍රමයකි ලේඛනය. වාක්‍ය රචනය ද ලේඛන ගණයට ඇතුළත් වේ. වාක්‍ය රචනය පිළිබඳවත් නිවැරදි ව රචනාවක් ලිවීමේ ක්‍රමවේදයත්, රචනා වර්ග හා රචනාවකින් ඇති ප්‍රයෝජන පිළිබඳවත් මේ පාඩමෙන් අවබෝධයක් ලබා ගැනීමට ඔබට පුළුවන.

පන්තියේ සියලු දෙනා අසුන්වලින් නැගිට ඇඳිලි බැඳ නමස්කාර කරමින් "තෙරුවන් සරණයි" යනුවෙන් ආශීර්වාද කොට, පන්තියට වැඩම කළ සුජාත පණ්ඩිත හාමුදුරුවන් පිළිගත්හ. උන්වහන්සේ ද සියලු දෙනාට තම ආචාරය පිළිගැන්වූ හ.

සුජාත පණ්ඩිත හාමුදුරුවෝ :- පසුගිය දවසේ පාඩම අවසානයේ හැම දෙනාට ම මතක් කළා රචනා පිළිබඳ ව තොරතුරු රැස්කර ගෙන එන්න කියලා, සුදනමෙන් ඇවිත් ඇති කියලා හිතනවා. පන්තියේ හැම දෙනා ම ඇතුළත් වෙන විදියට කුසපත් ඇදීමකින් කණ්ඩායම් හතරකට බෙදා ගන්නවා. ඒ කණ්ඩායම් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා කියලා නම් කරනවා.

- කණ්ඩායමේ සාමාජිකයින්ගේ කැමැත්තෙන් නායකයකු පත්කර ගන්න ඕන.
- එක් කණ්ඩායමකට එක ප්‍රශ්නය බැගින් ලැබෙනවා.
- සාමාජිකයින් සියලු දෙනාගේ සහභාගිත්වයෙන් පිළිතුරු සකස් කළ යුතු යි.

❍ අවසානයේ කණ්ඩායම් නායකයා ඒ පිළිතුරු ඉදිරිපත් කළ යුතු වෙනවා.

**මෙත්තා** - රචනාවක් යනු කුමක් ද?
**කරුණා** - රචනාවක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?
**මුදිතා** - විවිධ රචනා වර්ග මොනවා ද?
**උපෙක්ෂා** - රචනාවක හැඩය හා ආකෘතිය දක්වන්න.

කණ්ඩායම් ක්‍රියාකාරකමෙන් පසුව ඒ ඒ කණ්ඩායම් නායකයින් ඉදිරිපත් කළ පිළිතුරු පත්‍ර පහත දැක්වේ.

## "මෙත්තා" කණ්ඩායම

☞ අප හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා භාෂාවෙහි ව්‍යවහාර ප්‍රභේද දෙකක් දැකිය හැකි ය. එනම් ලේඛනය හා කථනය යි.
☞ වාක්‍ය රචනය ලේඛන ගණයට ඇතුළත් වේ.
☞ කිසියම් මාතෘකාවකට අනුව කරුණු ක්‍රමානුකූල ව ගළපා ඉදිරිපත් කිරීම වාක්‍ය රචනය යි.
☞ කරුණු ඉදිරිපත් කිරීමේ දී නිර්මාණාත්මක ව හා අලංකාර සහිත ව ඉදිරිපත් කරන රචනය සමහරු නිබන්ධ නමින් ද හඳුන්වති.

## "කරුණා" කණ්ඩායම

☞ මාතෘකාවට අදාළ කරුණු වැඩිපුර සොයා ගැනීම රචනාව සාර්ථක කර ගැනීමට උපකාර වේ.
☞ සොයාගත් කරුණු ගුණාත්මක ව හා නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමෙන් රචනාව අලංකාර වේ.
☞ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.
☞ පිලි භාවිතය, විරාම ලකුණු යෙදීම, නිවැරදි ව්‍යාකරණය රචනාවේ සාර්ථකත්වයට හේතු වේ.
☞ අවශ්‍ය තැන්වල දී ඡේද වෙන් කොට දැක්වීම ද සාර්ථක රචනයක ලක්ෂණයකි.
☞ අදහස් නිවැරදි ව හා පැහැදිලි ව ප්‍රකාශ කිරීම ද රචනාවේ සාර්ථකත්වයට හේතු වේ.

### "මුදිතා කණ්ඩායම"

☞ වාක්‍ය රචනා වර්ග කීපයකට බෙදිය හැකි ය. එනම් කථන රචනා, වර්ණනාත්මක රචනා, විවරණ රචනා හා කාල්පනික රචනා වශයෙනි.

☞ ඉතිහාස කථාවක්, චරිත කථාවක් වැනි මාතෘකා ඔස්සේ ලියැවෙන රචනා කථන රචනා වේ.

උදා :- මිහිඳු මහ රහතන් වහන්සේ
මහවැව් ඉදිකළ හෙළ රජවරු

☞ කිසියම් සිද්ධියක් හෝ ගැටලුවක් දෙස විවිධ දෘෂ්ටීන් අනුව බැලිය හැකි ය. එසේ බලා ලියනු ලබන රචනාව වර්ණනාත්මක රචනා නම් වේ.

උදා :- සුන්දර කඳුකරය
හිරු බැස යන මොහොතක මුහුදු වෙරළක දී

☞ යම් ගැටලුවක් කෙරෙහි විමර්ශනාත්මක ව බලා තර්කානුකූල ව කරුණු ගෙනහැර දක්වමින් කෙරෙන රචනා විවරණ රචනා නම් වේ.

උදා :- සැනසුමට මග මැදුම් පිළිවෙත ය.
ලෝක සාමයට මග

☞ නිර්මාණාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන රචනා කාල්පනික රචනා වේ.

උදා :- අඟහරු ලොවට පා තැබුවෙමි.
මම ගුවන් නියමුවෙක්මි.

### "උපෙක්ෂා කණ්ඩායම"

☞ රචනාවක ප්‍රධාන කොටස් තුනක් දැකිය හැකි ය. එනම්.

1. ආරම්භය
2. ස්කන්ධය
3. අවසානය

☞ ආරම්භය කියවන්නාගේ සිත් ඇද බැඳ තබා ගැනීමටත් ප්‍රබෝධයක් ඇති කිරීමටත් සමත් වීම වැදගත් වේ. රචකයාගේ දක්ෂතාව මත ප්‍රබල ආරම්භයක් ලබාගත හැකි ය.

☞ රචනාවක මැද කොටස අන්තර්ගතය යි. මාතෘකාවට අදාළ කරුණු අනුපිළිවෙළින් ඇතුළත් වන්නේ මේ කොටසට යි.

☞ සමස්ත කරුණු සම්බන්ධ කොට රචනයේ අවසානය සටහන් වේ.

☞ සමස්ත කරුණු සම්පිණ්ඩනය කොට රචනයේ අවසානය සැකසෙයි. විමර්ශනාත්මක රචනයක දී රචකයාට යම් යම් නිගමන ද ඉදිරිපත් කිරීමට සිදුවේ.

☞ රචනාවක් සාර්ථක ව ලිවීමට ඒ පිළිබඳ ව සැකිල්ලක් සකසා ගැනීම ප්‍රයෝජනවත් ය. පහත දක්වෙන රචනා ආකෘතිය සාර්ථක රචනයක් ලිවීමට ඔබට උදව් වනු ඇත.

| | | |
|---|---|---|
| මාතෘකාව | - | අධ්‍යාපන චාරිකාවක් |

| | | |
|---|---|---|
| සැකිල්ල | | |
| ආරම්භය | - | මූලික යෝජනාව හා සූදනම |
| ස්කන්ධය | - | **1 ඡේදය**<br>ගමනට අවශ්‍ය තොරතුරු කණ්ඩායම් වශයෙන් බෙදී රැස් කිරීම, ගමන් පහසුව, අවසර පත්‍ර ආදිය |
| | - | **2 ඡේදය**<br>ගමනාරම්භය<br>නරඹන ස්ථාන |
| | - | **3 ඡේදය**<br>අපේක්ෂිත ප්‍රතිඵල<br>ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ<br>මුහුණපෑමට සිදු වූ බාධා හා අත්දැකීම් |

සුජාත පණ්ඩිත හාමුදුරුවෝ :- ඉහත සාර්ථක රචනාවක් ලිවීමට උවමනා කරුණු බොහෝ ම හොඳට ගොනු කරලා තිබුණා. කණ්ඩායමේ හැම දෙනා ම උනන්දුවෙන් වැඩ කළ නිසා සියලු දෙනාට ම හොඳ අවබෝධයක් ලැබෙන්න ඇති. දැන් අපි ඒ උගත් කරුණු සැලකිල්ලට ගෙන අභ්‍යාසයේ යෙදෙමු.

## ක්‍රියාකාරකම 9.1

1. පහත දැක්වෙන මාතෘකාවලට රචනා සැකිලි පිළියෙල කරන්න.

   1. මා දුටු පෙරහැරක්
   2. පූජනීය දළඳ මැදුර
   3. මා පැවිදි වූ ද
   4. සිංහල උපදේශ කාව්‍ය

2. දී ඇති මාතෘකාවලට ආරම්භක ඡේදය බැගින් ලියන්න.

   1. කළගුණ සලකමු
   2. ජනමාධ්‍ය හා ළමා පරපුර
   3. පරිසර සංරක්ෂණය
   4. 2600 සම්බුද්ධත්ව ජයන්තිය

3. පහත සඳහන් මාතෘකා යටතේ රචනා ලියන්න.

   1. විහාරස්ථානය සමාජසේවා මධ්‍යස්ථානයක් ලෙස
   2. අනගාරික ධර්මපාල තුමා
   3. උත්සාහයෙන් ජය ලැබේ.

ixl ,ankd

**කණ්ණාඩියත් මිනිස් සිතත් එක සමාන ය.**
**බිඳුනොත් නැවතත් සකස් කළ නොහැකි ය.**



නොමිලේ බෙදා හැරීම පිණිසයි